සියළුම හිමිකම් ඇවිරිණි
All Right Reserved

බ /විශාඛා බාලිකා මධ්‍ය මහා විද්‍යාලය- බණ්ඩාරවෙල

B/ Vishaka Balika M.M.V - Bandarawela

දෙවන වාර පරීක්ෂණය - 2024

ගණිතය I
Mathematics I

10 ශ්‍රේණිය
Grade 10

කාලය : පැය 02
Time : 02 hours

විභාග අංකය

....

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු 6 කින් සමන්විතය.
* නියමිත ස්ථානයේ ඔබේ නම නිවැරදිව ලියන්න.
* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
* පිළිතුරත් එම පිළිතුරු ලබා ගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
* ***A*** කොටසෙහි 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 02 බැගින් ද ***B*** කොටසෙහි එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්ද ලැබේ.
* කටු සටහන් අවශ්‍ය වේ නම්, උත්තර ලියන කඩදාසියක එය සිදු කරන්න.

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා පමණි

	ප්‍රශ්න අංකය	ලකුණු
A	1 - 25	
B	**1**	
	2	
	3	
	4	
	5	
	මුළු එකතුව	

A කොටස
සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න

01. සිතුම් පැන්සල් 3 ක් හා රු. 92 ක් වටිනා පොතක් ගෙන වෙළෙන්දාට රු. 200 ක් දුන් විට ඔහුට ඉතිරි මුදල ලෙස රු. 33 ක් ලැබුනේ නම් පැන්සලක මිල සොයන්න.

02. සුළු කරන්න : $\frac{4}{x-2} + \frac{2}{2-x}$

03. ABC ත්‍රිකෝණයේ වර්ගඵලය $36cm^2$ නම් AB පාදයේ දිග සොයන්න



04. සුළු කරන්න : $\frac{3}{7} - \frac{5}{7}$ න් $\frac{2}{5}$

05. 6, 3, 7, 8, 9, 4, 3, 8, 3, 5, 10, ... මෙම සංඛ්‍යා සමූහයේ

(i)මාතය

(ii)මධ්‍යස්ථය සොයන්න.

06. නේවාසිකාගාරයක ළමයින් 10 දෙනෙකුට දින 8 කට ප්‍රමාණවත් ආහාර ඇත. ළමයින් දෙදෙනකු අසනීප වීම නිසා නිවෙස් බලා පිටව ගියේ නම් එම ආහාර ඉතිරි ළමයි සඳහා දින කීයකට ප්‍රමාණවත් ද ?

07. $(x+1)^2$ හා x^2-1 යන වීජීය ප්‍රකාශන දෙකෙහි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

08. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් x හි විශාලත්වය සොයන්න.



09. $x^2-5x=0$ විසඳන්න.

10. රු. 2000 ට ගත් භාණ්ඩයක් රු. 2500 ට විකුණයි නම් වෙළෙන්දා ලැබෙන ලාභයේ ප්‍රතිශතය සොයන්න.

11. රූපයේ දක්වෙන්නේ ඍජුකෝණාස්‍ර හැඩති කාඩ්බෝඩ් කැබැල්ලක් නවා සකස් කර ගත් කුහර ප්‍රිස්මයකි.



(i) කාඩ්බෝඩ් කැබැල්ලේ දිග කොපමණද ?

(ii) ප්‍රිස්මයේ පෘෂ්ඨ වර්ගඵලය සොයන්න.

12. කාසියක් එක්වරක් උඩ දමනු ලැබේ.

(i) නියැදි අවකාශය ලියන්න.

$S=\{ \quad \}$

(ii) කාසියේ අගය ලැබීමේ සම්භාවිතාව සොයන්න.

13. රූපයේ දක්වෙන තොරතුරු ඇසුරෙන් x හා y කෝණවල අගයයන් සොයන්න.



14. මිනිත්තුවකට ජලය ලීටර් 40 ක සීඝ්‍රතාවයකින් ගලා එන නලයකින් ධාරිතාව ලීටර් 2000 ක් වන හිස් ටැංකියක් සම්පූර්ණයෙන් පිරවීමට ගත වන කාලය කොපමණද ?

15. ε={විදුහලේ 10 වසර ළමයි}

A={ගැහැණු ළමයි}

B={විදුහලේ 10 වසර සංගීතය හදාරන ළමයි}

අඳුරු කල කොටස කුලක අංකනයෙන් ලියා වචනයෙන් ද විස්තර කර දක්වන්න.



16. $B\hat{A}C$ කෝණ සමච්ඡේදකය AX වේ.

(i) x හි අගය සොයන්න.

(ii) AB හා AC පාද වල දිග අතර සම්බන්ධ්‍ය ලියන්න.



17. $y = 2x + 3$ සරල රේඛාවේ.

(i) අනුක්‍රමණය සොයන්න.

(ii) එම සරල රේඛාව y අක්ෂය ඡේදනය වන ලක්ෂයේ ඛණ්ඩාංකය සොයන්න.

18. $ABCD$ රොම්බසයකි. x හා y වල අගය සොයන්න.



19. ABC හා PQR ත්‍රිකෝණ අංගසම වේ. ඒ බව පෙන්වීම සඳහා සිසුවකු ලියා සටහනක් පහත දැක් වේ.
හිස්තැන් පුරවන්න.

ABC හා PQR ත්‍රිකෝණ වල

$PR = BC$

$P\hat{R}Q = C\hat{B}A$

...............=................

$ABC\Delta \equiv PQR\Delta$ (.....................................)



20. O කේන්ද්‍රය වු වෘත්තයේ $OX = 8cm$ හා AB පාදයේ දිග $30cm$ වේ නම් AX හි දිග සොයන්න.



21. $T = a + (n-1)d$ සූත්‍රයේ n උක්ත කරන්න.

22. රූපසටහනේ දී ඇති තොරතුරු අනුව c කෝණයේ අගය සොයන්න.



23. රූපයේ දැක්වෙන්නේ $y = ax^2 + c$ ආකාරයේ ශ්‍රිතයක ප්‍රස්තාරයකි. ප්‍රස්තාරය ඇසුරෙන්

(i) c හි අගය සොයන්න.

(ii) $-2 < x < 0$ පරාසය තුල ශ්‍රිතයේ හැසිරීම ගැන කුමක් කිව හැකි ද ?



24. O කේන්ද්‍රය වූ වෘත්තයේ A, B හා C වෘත්තය මත පිහිටි ලක්ෂ 3 කි. දී ඇති තොරතුරු ඇසුරෙන් පහත කෝණවල විශාලත්වය සොයන්න.

(i) $A\hat{O}B =$

(i) $C\hat{A}B =$



25. AB හා BC යනු ඉඩමකක මායිම් දෙකකි. BC මායිමට $5m$ දුරින් සිටිනසේත් AB හා BC මායිම් වල සමදුරින් පිහිටන සේත පහන් කණුවක් සිටුවිය යුතුය. පථ පිලිබඳ දැනුම ප්‍රයෝජනයට ගෙන පහන් කණුව සිටුවිය යුතු ස්ථානය දළ රූප සටහනකින් දක්වන්න.



B **කොටස**

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න

01. කැටයක තිබූ සම්පූර්ණ කාසි වලින් $\frac{1}{5}$ ක් රුපියල් දෙකේ කාසි විය. ඉතිරි කාසි සියල්ල රුපියල් පහේ කාසි හා රුපියල් දහයේ කාසි විය. රුපියල් දෙකේ කාසි හැර ඉතිරි කාසි වලින් $\frac{3}{8}$ ක් රුපියල් පහේ කාසි විය.

(i) රුපියල් පහේ සහ දහයේ කාසි වල ප්‍රමාණ මුළු කාසි වලින් කවර කාහායක් ද ?

(ii) රුපියල් දහයේ කාසි වල ප්‍රමාණය මුළු කාසිවලින් කවර භාගයක්ද ?

(iii) කැටයේ තිබූ $2, 5, 10$ කාසි ප්‍රමාණ අතර සරලම අනුපාතය ලියන්න.

(iv) කැටයේ තිබූ මුළු කාසි ගණන 400 ක් නම් එහි තිබූ රුපියල් දහයේ කාසි වල මුළු වටිනාකම කොපමණද ?

02. ගොඩනැගිල්ලක් ඉදිරිපිට වාහන නවතා තැබීම සඳහා සකස් කරන ලද බිම් කොටසක් රූපයේ දැක්වේ. මෙහි අර්ධ වෘත්තාකාර කොටසකින් හා ***ABCD*** කොටස ත්‍රපීසියමක හැඩය ගනී.



(i) ***BC*** චාප දිග සොයන්න

(ii) සම්පූර්ණ ඉඩමේ පරිමිතිය සොයන්න.

(iii) අර්ධ වෘත්තාකාර කොටසේ වර්ගඵලය සොයන්න.

(iv) මුළු ඉඩමේ වර්ගඵලය සොයන්න.

(v) මෙම බිම් කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා මිනිස් දින 14 ක් ගත වේ යැයි ගණන බලා ඇත. මෙම බිම් කොටසෙහි $61m^2$ කොන්ක්‍රීට් කිරීමට තනි පුද්ගලයකුට ගතවන දින ගණන සොයන්න.

03. 10 වසරේ සිසුන් පිරිසකගෙන් තමන් කැමති ක්‍රීඩාව පිළිබඳව විමසා ඒ පිළිබඳව තොරතුරු වට ප්‍රස්තාරයේ දැක් වේ. එහි දැක්වෙන තොරතුරු දැක් වේ.



(i) අඩු ම පිරිසක් කැමති කුමන ක්‍රීඩාවට ද ?

(ii) දැල් පන්දු වලට කැමති සිසුන් ගණන 36 යි නම් කණ්ඩායමේ මුළු සිසුන් ගණන කොපමණද ?

(iii) පාපන්දු වලට කැමති සිසුන් ගණන සොයන්න.

(iv) පාපන්දු තෝරා ගත් සිසුන් 12 ක් වොලිබෝල් තෝරා ගන්නා ලදි. එවිට වොලිබෝල් නිරූපනය කළ යුතු කෝණය කුමක් ද ?

04. (a) ප්‍රාදේශීය සභාවක් එම බල ප්‍රදේශයේ නිවසක් රු. 40 000 ක් ලෙස තක්සේරු කර ඇත. ඔහු එම නිවස සඳහා කාර්තුවකට රු. 500 ක වරිපනම් ගාස්තුවක් ගෙවයි.

(i) ඔහු අවුරුද්දකට ගෙවන වරිපනම් බද්ද කොපමණද ?

(ii) ප්‍රාදේශීය සභාව නිවස සඳහා අය කරන වාර්ෂික වරිපනම් බදු ප්‍රතිශතය කොපමණ ද ?

(iii) වාර්ෂික වරිපනම් බද්ද එකවර ගෙවන්නේ නම් 10% වට්ටමක් ලබා දෙයි. එවිට ගෙවිය යුතු බදු මුදල කොපමණ ද ?

(b) වෙළඳ සැලකින් රු. 60 000 ක් වටිනා රූපවාහිනියක් පොලී රහිතව සමාන මාසික වාරික 3 කදී ගෙවීමට මිල දී ගත හැක.

(i) මිලදී ගැනීමේදී වටිනාකමෙන් 18% ක වැට් බද්දක් අය කරයි. රූපවාහිනිය සඳහා ගෙවිය යුතු මුළු මුදල කොපමණද ?

(ii) මාසික වාරිකයක් කොපමණද ?

05. මල්ලක හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන අඹ රසැති ටොෆි 3 ක් ද දිවුල් රසැති ටොෆි 5 ක් ද ඇත. සඳුන් අහඹු ලෙස මල්ලෙන් එක් ටොෆියක් ගත්තේ නම්,

(i) ඉහත පරීක්ෂණයේ සියළු සිදුවීම් දැක්වෙන නියැදි අවකාශය ලියා දක්වන්න.

(ii) ඉවතට ගත් ටොෆිය අඹ රසැති ටොෆියක් වීමේ සම්භාවිතාවය කීයද ?

(iii) ඉවතට ගත් ටොෆිය අඹ රසැති ටොෆියක් නොවීමේ සම්භාවිතාවය කීයද ?

(b) එක්තරා රජයේ කාර්යාලයක රාජකාරියේ නියුතු රජයේ සේවකයන් පිළිබඳ තොරතුරු පහත වගුවෙහි නිරූපනය වේ. මෙම වගුව දක්වා ඇති තොරතුරුට අනුව තෝරා ගන්නා සේවකයෙකු් පිළිබඳ පහත සම්භාවිතා සොයන්න.

	පිරිමි	කාන්තා
නිළධාරින්	5	8
ලිපිකරුවන්	32	58

(i) නිළධාරිනියක් වීම.

(ii) ලිපිකරුවෙකු වීම.

සියළුම හිමිකම් ඇවිරිණි
All Right Reserved

බ /විශාඛා බාලිකා මධ්‍ය මහා විද්‍යාලය- බණ්ඩාරවෙල
B/ Vishaka Balika M.M.V - Bandarawela

දෙවන වාර පරීක්ෂණය - 2024

ගණිතය II
Mathematics II

10 ශ්‍රේණිය
Grade 10

කාලය : පැය 03
Time : 03 hours

- ***A*** කොටසෙන් ප්‍රශ්න **පහකුත්**, ***B*** කොටසෙන් ප්‍රශ්න **පහකුත්** තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

A කොටස

01. කුළී රථයක් දින 50 කදී ගමන් කල දුර පිළිබඳව තොරතුරු පහත වගුවේ දැක්වේ.

දුර ***km***	25	35	45	55	65	75
දින ගණන	7	10	15	8	6	4

(i) මාතය කුමක්ද ?

(ii) දිනකදී ගමන් කරන මධ්‍යන්‍යය දුර සොයන්න.

(iii) ඉන්ධන 1 ***l*** කින් 10 ***km*** ක් දුර යාමට හැකි නම් හා ඉන්ධන 1***l*** ක් රු. 350 ක් ද නම් මාසයකදී ඉන්ධන සඳහා වැය වන මුදල සොයන්න.

(iv) කුළි රථය 1 **km** යාම සඳහා රු. 60 ක් අය කරයි නම් මාසයක් තුල දී ඔහුට ලැබෙන ආදායම සොයන්න

02. පහත දැක්වෙන්නේ $y = x^2 - 3$ ප්‍රස්තාරය ඇඳීම සඳහා සකස් කරන ලද අසම්පූර්ණ අගය වගුවකි.

X	-3	-2	-1	0	1	2	3
Y	6	....	-2	-3	-2	1	6

(i) අගය වගුව සම්පූර්ණ කරන්න.

(ii) ***x***-අක්ෂය දිගේ කුඩා 10 කින් ඒකක 1 ක් ද ***y***-අක්ෂය දිගේ කුඩා කොටු 10 කින් ඒකක 2 ක් ද නිරූපණය කරමින් ඉහත ප්‍රස්තාරය ඇඳ දක්වන්න.

ප්‍රස්තාරය ඇසුරෙන්

(iii) සමමිතික අක්ෂයේ සමීකරණය ලියන්න.

(iv) වර්තන ලක්ෂයේ ඛණ්ඩාංකය ලියන්න.

(v) ප්‍රස්තාරයේ අගය ඍනව වැඩිවන පරාසය ලියන්න.

(vi) මෙම ප්‍රස්තාරය ඒකක 1 කින් ඉහළට උත්තාරනය කළ විට ලැබෙන ප්‍රස්තාරයේ සමීකරණය ලියන්න.

03. වාහනයක් ආනයනය කිරීමේදී 80% ක තීරු බද්දක් ගෙවිය යුතු වේ.

(i) වාහනයේ ආනයනික මිල ඩොලර් 20 000 කි. ඇමරිකන් ඩොලරයක් රු.220 යි නම් රථයේ ආනයනික මිල කීයද ?

(ii) තීරු බදු ගෙවීමෙන් පසු වාහනයේ වටිනාකම සොයන්න.

(iii) ආනයනකරු 20% ලාභ තබාගෙන වාහනය විකුණයි නම් මෙම වෙළදාමෙන් ඔහු ලබන ලාභය කොපමණද ?

(iv) රුපියලේ වටිනාකම අඩුවීම නිසා ඩොලරයක මිල 10% කින් ඉහළ ගියේ නම් වාහනයේ නව ආනයනික මිල කීයද ?

04. A, B, C යනු දකුණේ සිට උතුරට වැටි ඇති සෘජු මාර්ගයකි. මාර්ගයේ A හි සිටින සාගර 60^0 කි දිගාංශයකින් හා 50 m දුරින් තම නිවස දකියි. ඔහු එම මාර්ගය දිගේ 40 m ඉදිරියට (උතුර දෙසට) ගිය විට B සිට හරි නැගෙනහිරින් නිවස දකියි.

(i) ඉහත තොරතුරු දළ සටහනක ඇඳ ලකුණු කරන්න.

(ii) දළ සටහන් භාවිතයෙන් $1cm$ කින් $10m$ නිරූපණය කරනමින් ඉහත තොරතුරු සඳහා පරිමාණ රූපයක් අඳින්න.

(iii) ඒ ඇසුරින් නිවසේ සිට මහා මාර්ගයක ඇති කෙටිම දුර ගණනය කරන්න.

(iv) C සිට බලන විට සාගරගේ නිවස පිහිටා ඇත්තේ 140^0 ක දිගාංශයකින් නම් B සිට C ට ඇති දුර සොයන්න.

05. PQR ආස්තරයේ වර්ගඵලය වර්ග ඒකක 60 වේ නම්,

(i) x මඟින් $x^2+6x-112=0$ සමීකරණය සපිරෙන බව පෙන්වන්න.

(ii) ඉහත වර්ගජ සමීකරණයේ මුල ලබා ගැනීමෙන් ත්‍රිකෝණාකාර අස්තරයේ විකර්ණයේ දිග බෙදීමේ ක්‍රමය මඟින් ආසන්න දෙවන වන දශමස්ථානයට ලබා ගන්න.



06. (i) විසඳන්න. : $\frac{2x+5}{2} + \frac{3x-1}{4} = 4$

(ii) සුළු කරන්න. : $\frac{4x^3 \times x^{-2}}{2x^{-1}}$

(iii) $3x + 2y = -5$

$x + 4y = 0$ සමගාමී සමීකරණ විසඳන්න.

B කොටස

07. ග්‍රිල් මොස්තරයක් සැකසීම සැකසීම සඳහා යකඩ කම්බි කුරු 50 ක් අවශ්‍යය. නිර්මාණකරු ඒවා කපන ලද්දේ පළමු කැබැල්ලේ දිග $4cm$ ද ඉන්පසු කපන සෑම කුරක්ම ඊට පෙර කපන ලද කුරක දිගට වඩා $3cm$ වැඩිවන පරිදිය.

(i) ඔහු කපන ලද මුල් කම්බි කුරු 4 හි දිග අනුපිළිවෙලින් ලියන්න.

(ii) එම රටාවේ පොදු පදය ලබා ගන්න.

(iii) පොදු පදය ඇසුරෙන් ඔහු කපන ලද 10 වන කැබැල්ලේ දිග සොයන්න.

(iv) දිග $43cm$ වන්නේ කී වැනි කැබැල්ලද ?

(v) පොදු පදය $5\text{-}3n$ වන සංඛ්‍යා රටාවේ 12 වැනි පදය සොයන්න.

08. cm/mm පරිමාණය සරල දාරයක් හා කවකටුව පමණක් භාවිතා කරමින් නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින් පහත නිර්මාණ සිදු කරන්න.

(i) $AB=8cm$, $A\hat{B}C=45^0$ හා $B\hat{A}C=75^0$ වන පරිදි ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) BC පාදයේ ලම්බ සමච්ඡේදකය නිර්මාණය කර එය BA ඡේදනය කරන ලක්ෂ්‍යය X ලෙස නම් කරන්න.

(iii) AB හා BC පාද දෙකට සම දුරින් ගමන් කරන ලක්ෂ්‍යයේ පථය (ii) හි ලම්බ සමච්ඡේදකය සමඟ ඡේදනය වන ලක්ෂ්‍යය Y ලෙස නම් කරන්න.

(iv) BY ට දිගින් සමාන පාදය නම් කර එම පාදය හඳුනා ගැනීමට භාවිතා කල ප්‍රමේයය ලියා දක්වන්න.

09. (a) $log_5 3 = x$ නම්,

$log_5 75$ සඳහා x ඇසුරෙන් ප්‍රකාශනයක් ගොඩනගන්න.

(b) එක්තරා හෝටලයක ජල තටාකයක දිග මීටර් 15.2 ද පළල මීටර් 10 ද වේ. එහි ජලය සෙන්ටි මීටර් 208 දක්වා ජලය පිරී පවතින්නේ නම්, ලඝු ගණක වගුව ඇසුරෙන් ජල තටාකයේ පිරී ඇති ජල පරිමාව ලීටර් වලින් සොයන්න.

10. (a) ACB සරල රේඛාවකි.
$A\hat{C}D = 2D\hat{C}E$ ද, $F\hat{C}B = 2E\hat{C}F$ ද නම් $D\hat{C}F$ අගය සොයන්න.



(b) PQR යනු ඕනෑම ත්‍රිකෝණයකි. P හිදී PR පාදයට ඇඳි ලම්බකයත්I $P\hat{R}Q$ කෝණයේ සමච්ඡේදකයත් S හිදී හමු වේ.
$P\hat{Q}R + Q\hat{P}R = 2P\hat{S}R$ බව සාධනය කරන්න.

11. O යනු AOB සමපාද ත්‍රිකෝණයක් වන පරිදි $ABCD$ සමචතුරස්‍රය තුල පිහිටි ලක්ෂ්‍යයකි.

(i) රූපසටහන පිළිතුරු පත්‍රයේ පිටපත් කර එහි දත්ත ලකුණු කරන්න.

(ii) BOC සමද්වි පාද ත්‍රිකෝණයක් බව පෙන්වන්න.

(iii) $AOD\,\Delta \equiv BOC\,\Delta$ බව පෙන්වන්න.

(iv) $D\hat{O}C$ අගය සොයන්න.



12. (a) 10 ශ්‍රේණියක ළමයි 46 ක් සිටිති. ඔවුන්ගෙන් 27 ක් ගැහැණු ළමයින්ය. ගැහැණු ළමයින්ගෙන් 22 දෙනෙකුට ගණිතයට ලකුණු 40 ට වඩා වැඩිය. පිරිමි ළමයින් 15 දෙනකුට ගණිතයට ලකුණු 40 ට වඩා වැඩිය.

(i) ඉහත තොරතුරු සුදුසු වෙන් රූප සටහනක දක්වන්න

(ii) ලකුණු 40 හෝ 40 ට අඩු ගැහැණු ළමයි දක්වෙන ප්‍රදේශය අඳුරු කරන්න.

(iii) ලකුණු 40 හෝ 40 ට අඩුවෙන් ලබා ගත් පිරිමි ළමයෙකුගේ සම්භාවිතාවය කීයද ?

(b) $\varepsilon = \{3, 6, 9, 12, 15, 18, 21, 24, 27, 30\}$

$A = \{6, 12, 18, 24, 30)$

$B = \{ 9, 18, 27 \}$

ඉහත කුලක ඇසුරෙන්

$n(A \cup B) = n(A) + n(B) - n(A \cap B)$ ප්‍රකාශනය සත්‍යාපනය කරන්න.

PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න